**හෝමියෝපත වෛද්‍ය සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන 2011 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂය තුළ බැංකු ඉතිරි කිරීමේ ගිණුමකින් තාවකාලිකව ලබාගත් රු.505,000 ක් තවත් බැංකුවක ජංගම ගිණුමක් වෙත මාරු කිරීමේදී එම බැංකු ගිණුම බැර කරනවා වෙනුවට විවිධ ආදායම් ගිණුමට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය ඒ හා සමාන ප්‍රමාණයෙන් වැඩියෙන දැක්වුණි.

(ආ) සායනවල සේවයේ යෙදෙන වෛද්‍ය නිලධාරීන් සහ ඖෂධ සංයෝජකවරුන් 07 දෙනෙක් සඳහා වසර ගණනාවක සිට වැටුප් ගෙවා තිබුණද එම නිලධාරීන් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 1.2.2 හඳුනා නොගත් ශේෂ

2009 වර්ෂයේ සිට දිගින් දිගටම පැවත එන රු.7,100 ක් වූ හඳුනා නොගත් ශේෂයක් බැංකු සැසඳුම්හි දක්වා තිබූ අතර එය හඳුනාගෙන සුදුසු පියවරක් ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

#### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනයන්හි විවිධ ආදායම් යටතේ දක්වා තිබූ රු.39,990 ක මුදල සඳහා වූ ලැබීම් කුවිතාන්සි විගණනයට ඉදිරිපත් නොවුණි.

#### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකාරිත්ව තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීතිරීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

මු.රෙ. 756 ප්‍රකාරව 2011 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.74,938 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ රු.382,792 ක ඌනතාවයක් විය.

ඉකුත් වර්ෂයේ පළමු මාස 7 ට අදාළ වියදම අමාත්‍යාංශය විසින් වැයකර තිබූ අතර අවසන් මාස 5 ට අදාළ වියදම් පමණක් වෛද්‍ය සභාව විසින් වැය කර තිබූ හෙයින් මාස 5 ක ප්‍රතිඵලය සමඟ වර්ෂයක තත්ත්වය පිළිබඳ සැසඳීමක් කිරීමට නොහැකි විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නීත්‍යානුකූල වෛද්‍ය සභාවක් නොතිබීම හේතුවෙන් 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 22 වගන්තියේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද නොහැකි වී තිබුණි.

i. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා අදාළ පර්යේෂණ හා අධ්‍යයන ධෛර්යමත් කිරීම

ii. හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය, ආනයනය, විකිණීම හා බෙදාහැරීම සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම

iii. හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු සම්පාදනය කරගෙන තිබුණද, වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව සකස් කර අදාළ කාර්යය ඉටු කිරීමේ කටයුතු සිදු කිරීමට විගණිත දිනය වූ 2012 ජූලි 31 දින වනවිටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) ප්‍රදේශ 7 ක් තුළ පවත්වාගෙන යනු ලබන හෝමියෝපති වෛද්‍ය සායන 7 කින් සායන 4 ක් සඳහාම රෝගී සහභාගීත්වය 4% සිට 20% දක්වා වූ පරාසයකින් අඩු වී ඇති බැව් නිරීක්ෂණය විය. එසේ වුවද දෙහිවල සායනයෙහි රෝගී සහභාගීත්වය 55% කින් වැඩිවී තිබුණි.

(ඇ) **වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම**

(i). 2011 ජනවාරි 31 දින වන විට වෛද්‍යවරුන් 191 ක් ලයාපදිංචි කර තිබුණු අතර ඒ පිළිබඳ විස්තර මෙසේය.

| | ලියාපදිංචියට අදාල පනතේ වගන්තිය | විස්තරය | ලියාපදිංචි කර තිබූ වෛද්‍යවරු සංඛ්‍යාව |
|---|---|---|---|
| I. | 27(1) (අ) | හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ වසර 4 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම | 54 |
| II. | 27(1) (ඇ) | වසර 10 කට නොඅඩු කාලයක් හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ නියැලී සිටින සභාව විසින් පිළිගත් වෛද්‍යවරුන් | 35 |
| III. | 27 (2) | වසර 3 කට නොඅඩු කාලයක් වෛද්‍ය වෘත්තියේ නියැලී සිට ඇති හා සභාව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයකට පෙනී සිට සුදුසුකම් ලැබූ වෛද්‍යවරුන් | 50 |
| IV. | 27 (5) | තාවකාලික ලැයිස්තුවේ නම් ඇතුලත් වෛද්‍යවරුන්ට ලිඛිත විභාගයකින් පසුව ස්ථිර ලියාපදිංචිය ලබාදීම | 52 |
| | | | 191 |

(ii). 2011 වර්ෂයේ ජනවාරි මාසයෙන් පසුව වෛද්‍ය සභාවක් නොතිබීම හේතුවෙන් වර්ෂය තුළදී පනතේ 27(1) (අ) වගන්තිය යටතේ 2011 ජනවාරි 31 වනවිට වෛද්‍යවරුන් පස්දෙනෙක් පමණක් ලියාපදිංචි කර තිබුණි.

3.2 <u>නිෂ්කාර්ය වත්කම්</u>

හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය වෙනුවෙන් 2009 වර්ෂයේදී මිලදී ගත් රු.1,199,254 ක් වටිනා ස්ථාවර වත්කම් විගණිත දිනය වූ 2012 ජුලි 31 දින වනවිටත් නිෂ්කාර්යව පැවතුණි.

4. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

4.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසාන වීමෙන් දින 60 කට පසුව විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද , වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශන මාස 04 ක ප්‍රමාදයක් සහිතව 2012 ජුල 17 දිනදී ඉදිරිපත් කර තිබුණි.

2011 වර්ෂය තුළදී ජනවාරි මාසය සඳහා පමණක් ප්‍රදාන සභාව වෙත මුදාහැර තිබුණු අතර වර්ෂයේ සෙසු මාස තුළ සියලු වියදම් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් අදාළ වැය ශීර්ෂය යටතේ සිදු කර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අමාත්‍යාංශය විසින් සිදු කරන ලද සියළු වියදම්වල එකතුවට සමාන මුදලක් වෛද්‍ය සභාවට ලබාදුන් ප්‍රතිපාදන ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

4.2 <u>සංයුක්ත සැලැස්ම</u>

2011-2015 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි ඉකුත් වර්ෂ 3 කට අදාළව මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය කිරීමක් සිදු කර නොතිබුණි.

4.3 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

2011 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද වෛද්‍ය සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසුව ඇති වූ ගැටළු සහගත තත්ත්වය මත නව වෛද්‍ය සභාවක් පත් නොකිරීම හේතුවෙන් එහි සඳහන් ඉලක්ක සපුරා ගැනීමක් සිදු නොවුණි.

4.4 <u>අයවැය ලේඛනමය පාලනය</u>

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 5.2.4 ඡේදය ප්‍රකාරව 2011 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

4.5 <u>වාර්ෂික වාර්තා සභාගත කිරීම</u>

හෝමියෝපති වෛද්‍ය සභාව ආරම්භයේ සිට 2010 වර්ෂය වනතෙක් වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුවේ.

(අ) ගිණුම් පොත් පැවැත්වීම

(ආ) වෛද්‍ය ලියාපදිංචි ගාස්තු ලේඛන යාවත්කාලීන කිරීම